Action 07/04/10

15

30/05/07.

# පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනත

පනත සඳහන් සංශෝධනයන් මෙහි ඇතුළත්ව ඇත.

1946යේ අංක 57 දරන ආඥා පනත

1957

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

කොළඹ ආණ්ඩුවේ ග්‍රන්ථ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැක.

මිල : රු.

තැපැල් ගාස්තුව : රු. 4.60

# පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි

පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි හා සම්බන්ධ වූ නීතිය ඒකාබද්ධ කරලීම සඳහා පනවන ලද ආඥා පනතකි

(1950 ජනවාරි 1 වැනි දින)

## I වෙනි පරිච්ඡේදය

### ප්‍රාරම්භය

1. මෙම ආඥා පනත පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනත නමින් හැඳින්විය හැකිය. ලුහුඬු නාමය.

2. මෙම ආඥා පනත මගින් අවලංගු කරන ලද කිසියම් නීතියක් යටතේ සම්පාදිතව හෝ සම්පාදිත හැටියට සලකන ලදුව, මෙම ආඥා පනත වලංගුවීමේදී බලපවත්වමින් තිබුණු සෑම ප්‍රකාශනයක්, ව්‍යවස්ථාවක්, දන්වීමක්, අතුරු ව්‍යවස්ථාවක් සහ ප්‍රසිද්ධ නියෝගයක්ම, මෙම ආඥා පනත සම්මත නොවූ කලෙක පරිද්දෙන් දිගටම වලංගුව පවත්නේය. එසේම, ඒවා මෙම ආඥා පනත යටතේම සම්පාදිතවූ ඒවා ලෙස වලංගු වනු පමණක් නොව මෙම ආඥා පනත යටතේ අවලංගු කිරීමට, වෙනස් කිරීමට හෝ වෙනත් අයුරකින් සැකසනු ලැබීමටද පිළිවන් වන්නේය. එසේම, මෙම ආඥා පනත වලංගු වීමෙන් පසුව ඒවාට අවනත නොවීම හෝ ඒවා කඩකිරීම සම්බන්ධයෙන් වරදකාරයා වන කවර පුද්ගලයෙකුට වුවද, මෙම ආඥා පනත යටතේ සම්පාදිතව ව්‍යවස්ථාවකට, අතුරු ව්‍යවස්ථාවකට හෝ ප්‍රසිද්ධ නියෝගයකට අවනත නොවීම හෝ එබන්දක් කඩ කිරීම සම්බන්ධයෙන් දඬුවම් පමුණුවන ආකාරයෙන්ම දඬුවම් පැමිණවිය හැක්කේය. දැනට තිබෙන ප්‍රකාශන, ව්‍යවස්ථා, දන්වීම්, අතුරු ව්‍යවස්ථා ආදිය අවලංගු කරන තුරු වලංගු බව.

3. මෙම ආඥා පනතේ, ඉදින් පද සංසන්දනයේදී වෙනත් අර්ථයක් අනාගෙයදන කල්හි— පදාර්ථ.

"පරිපාලන ප්‍රදේශය" යනුවෙන් පළාත් පාලනය පිළිබඳ (පරිපාලන ප්‍රදේශ) ආඥා පනතේ දෙවැනි වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් විස්තර කරන ලද පරිපාලන ප්‍රදේශයක් අදහස් වන්නේය.

"පෞද්ගලික සුසානය" යනුවෙන්, මෙම ආඥා පනත වලංගු වන අවස්ථාවේදී, මිය ගියවුන් වැළලීම හෝ ආදාහන කිරීම සඳහා පාවිච්චි කරන ලද්දාවූ හෝ මිය ගියවුන් වැළලීම හෝ ආදාහන කිරීම සඳහා III වෙනි පරිච්ඡේදයේ විධිවිධාන යෙදී ඇති පරිදි නැතහොත් එයින් පසුව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද්දාවූ (පොදු සුසානයක් නොවන) කිසියම් ඉඩමක් හෝ භූමියක් අදහස් වන්නේය.

1862

"පොදු සුසානය" යනුවෙන් 1862 අංක 12 දරන ආඥා පනතේ හෝ මෙම ආඥා පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලද පොදු සුසානයක් අදහස් වන්නේය.

"නිසි බලධරයා" යනුවෙන්, නගර සභාවක් හෝ පළාත් පාලන ආඥා පනත යටතේ පිහිටුවන ලද දිස්ත්‍රික් සභාවක් හෝ ප්‍රාදේශික සභාවක් හෝ සනීපාරක්ෂක සභාවක් ඇතුළත පිහිටි ප්‍රදේශයක් සම්බන්ධයෙන් සලකන කල්හි, එම නගර සභාව, දිස්ත්‍රික් සභාව හෝ සනීපාරක්ෂක සභාව අදහස් වන්නේය. තවද, සෙසු සෑම නගරයක්, ගමක් හෝ ස්ථානයක් සම්බන්ධයෙන් වුවද සලකන කල්හි, එම නගරය, ගම හෝ ස්ථානය පිහිටි ඇති පරිපාලන ප්‍රදේශයේ උප පළාත් පාලන කොමසාරිස්වරයා අදහස් වන්නේය.

ප්‍රකාශන ආදිය ගැසට් පත්‍රයේ පළකළ යුතු බව.

4. මෙම ආඥා පනත යටතේ සම්පාදනය කරනු ලැබ නිකුත් කරනු ලබන සියලු ප්‍රකාශන, ව්‍යවස්ථා, දැන්වීම්, අතුරු ව්‍යවස්ථා හා ප්‍රසිද්ධ නියෝග, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරවිය යුතුය.

## II වෙනි පරිච්ඡේදය

### පොදු සුසාන

පොදු සුසාන පිහිටුවීම ඇමතිවරයාට නියම කළහැකි බව.

5. (1) මළවුන් වැළලීම හෝ ආදාහන කිරීම පිණිස, ආඥාවක් නිකුත් කරමින් එහි සඳහන් කරන හා විස්තර සීමා ඇතුළත පොදු සුසානයක් පිහිටු විය්නට, එසේ කිරීම ප්‍රඥාවන්තයයි තමාට හැඟෙන අවස්ථාවකදී, අමාත්‍යවරයාට පිළිවන. එසේම මීට ප්‍රථම පිහිටුවන ලද හෝ මෙයින් පසුව පිහිටුවන ලද සුසානයක භූමි ප්‍රමාණය වැඩිකිරීමට, අඩුකිරීමට හෝ එවනාත් අයුරකින් වෙනස් කිරීමට එබඳු ආඥාවක මාර්ගයෙන් අමාත්‍යවරයාට පිළිවන.

එසේම සෙසු තැන්වල මිනී වැළලීම තහනම් කිරීම.

(2) ඉහත කී පරිදි සුසානයක් පිහිටුවනු ලැබූ සෑම අවස්ථාවකදීම, ආඥාවක් නිකුත් කරමින් එහි සඳහන් කරනු ලබන වකවානුවෙන් පසුව, එම සීමාව ඇතුළත පිහිටි සෑම ප්‍රසිද්ධ සුසානයකම හෝ පෞද්ගලික සුසානයකම හෝ, කිසියම් පොදු සුසානයක හෝ පෞද්ගලික සුසානයක මිනී වැළලීම හෝ ආදාහන කිරීම සම්පූර්ණයෙන් හෝ සවල්ප වශයෙන් තහනම් කරන්නට අමාත්‍යවරයාට පිළිවන.

එසේම, ආඥා පනතේ සමහර කොටස් අදාළ වීමෙන් ඉවත් නිදහස් කළ හැකි බව.

(3) මීට ප්‍රථම හෝ මීට පසු පිහිටුවන ලද කවර පොදු සුසානයක් වුවද සම්පූර්ණයෙන් හෝ එහි කොටසක්, අංක 10, 15, 16 සහ 23 දරන වගන්ති සියල්ලම හෝ ඉන් කිසියම් වගන්තියක් අදාළ නොවන පරිද්දෙන් නිදහස් කරන්නටත්, එබඳු නිදහස් කිරීමක් කලින් කල ඉවත් කර ගන්නට හෝ අලුත්වැඩියා කරන්නටත් අමාත්‍යවරයාට පිළිවන. එබඳු කිසියම් නිදහසක් දීම, ඉවත් කර ගැනීම හෝ අලුත්වැඩියා කිරීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුත්තේය.

*ඒ කාර්ය්‍ය සඳහා ඉඩම් සැපයිය යුතු බව.*

6. යම් නගරයක සීමාව ඇතුළතදී මිය යන පුද්ගලයින් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම සඳහා පොදු සුසානයක් පිහිටුවීමේ කාර්ය්‍ය උදෙසා හෝ එමගින් ප්‍රථම හෝ පසුව පිහිටුවනු ලැබූ කිසියම් සුසානයක භූමි ප්‍රමාණයට එකතු කිරීම සඳහා ඉඩම් සැපයීම, එම නගරය ඉදින් මහා නගරයක් නම් එම මහා නගර සභාවේද* ඉදින් පළාත් පාලන සභාවකට හෝ සුළු නගර සභාවකට අයිති නගරයක් නම් එම පළාත් පාලන සභාවේ හෝ සුළු නගර සභාවේද යුතුකම වන්නේය.

*අත්හරින ලද සුසාන පිළිබඳ ඉඩම් විකිණීම තහනම් කර ඇති බව.*

7. මිය ගියවුන් භූමදාන කිරීම සඳහා කැප කොට තිබී හෝ විශේෂයෙන් වෙන් කොට තිබී, 1802 කේ අංක 12 දරන ආඥා පනතේ හෝ මෙම ආඥා පනතේ විධිවිධාන යටතේ මෘතදේහ භූමදාන කිරීම නවත්වා ඇති සවිර ඉඩමක් වුවද, අමාත්‍යවරයාගේ අවසරය නොමැතිව විකිණීම, මනාපයක් කිරීම හෝ සෙසු කිසිම කාර්ය්‍යයක් සඳහා යෙදවීම හෝ නොකළ යුතුය. එසේම මුලින් කියන ලද පරිදි අවසරයක් නොමැතිව කරන ලද හැම විකුණුමක් මෙන්ම සෙසු අන්දමේ යමක් කිරීමද නිෂ්ප්‍රභ වන්නේය. තවද එබඳු සවිර ඉඩමක් නමුදු අමාත්‍යවරයාගේ අවසරයක් නොමැතිව පැවරීම් කරන සවිර පුද්ගලයෙක් වුවද වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා කිරීමේ දී රුපියල් දහසකට නොවැඩි දඩයකටද යටත් වන්නේය.

*පොදු සුසාන ගෙවල්වලට දුරින් පිහිටිය යුතු බව.*

8. කිසියම් නිවාසයක අයිතිකාරයාගෙන් හෝ බදුකාරයාගෙන් හෝ පදිංචිකාරයාගෙන් ලියවිල්ලකින් ලබන ලද අවසරයක් ඇතිව මිස, කිසිම පොදු සුසානයක කිසිම කොටසක්, කිසිම නිවාසයකට අඩි පනහකට වඩා කිට්ටු වන ලෙස නොතැනිය යුතුය.

*පල්ලි ආදිය තැනිය හැකි බව.*

9. භූමදාන කිරීමේදී හෝ ආදාහන කිරීමේදී පවත්වනු ලබන ආගමික මෙහෙයය සිදු කිරීම සඳහා, සුසානයේ සීමාව ඇතුළත පල්ලි ආදිය ගොඩනැංවීමට බලය දෙන්නට ඊට නියි බලධරයාට පිළිවන.

*පොදු සුසාන වට කොට තිබිය යුතු බව. (1931 පේ 3, 7 වගන්ති)*

10. හැම පොදු සුසානයකුත්, හැම පොදු සුසානයක ආදාහනය සඳහා වෙන් කර තිබෙන හැම කොටසකුත්, යටත් පිරිසෙයින් අඩි හයක්වත් උස ඇති යම් ප්‍රාකාරයකින් හෝ යකඩ වැටකින් කොටු කළ යුතුවාක් මෙන්ම එම ප්‍රාකාරය හෝ වැට හැම විටම අලුත්වැඩියා කර තැබිය යුතුද වන්නේය.

*පුද්ගලික සුසානය වෙන් කර දීම.*

11. (1) කිසියම් පුද්ගලික සුසානයක සවිර කොටසක් වුවද, ඉදින් එය කිසියම් ආගමික නිකායක් විසින් ඉල්ලා සිටි කල්හි, එම ආගමික නිකායේ විශේෂ ප්‍රයෝජනය සඳහා එය විකුණන්නට නියි බලධරයාට පිළිවන. එසේ විකුණන ලද කොටස, මෙම ආඥා පනතේ අවශ්‍යතා සම්බන්ධයෙන් පමණක්, යථොක්ත භූමිය භාරව සිටි බලධරයා විසින් එබඳු ආගමික නිකායක් වෙනුවෙන් ඔප්පුවක් මගින් එම කොටස පවරා දෙනු ලැබූ හෝ එමගින් පසුව එම කොටස පවරා දෙනු ලබන පුද්ගලයා හෝ පුද්ගලයන් කෙරෙහි පැවරී පවතින්නේය.

---

* නගර සභාවක් හෝ සුළු නගර සභාවක් පිහිටුවා ඇති නගරයක් වූ කල්හි එකී නගර සභාව හෝ සුළු නගර සභාව සම්බන්ධයෙන් මෙම වගන්තිය අදාළ වන්නේය.

භාරකාරයින්ට පාලක මණ්ඩලයක් පත් කිරීමට පිළිවන් බව.

පාලක මණ්ඩලයේ බලතල

(2) සාමාජිකයින් තුන්දෙනෙකු හෝ වැඩි දෙනෙකුගෙන් සමන්විතවූ පාලක මණ්ඩලයක් පත් කිරීමට භාරකාරයින් ලෙස ක්‍රියා කරන තැනැත්තාට හෝ තැනැත්තන්ට නීත්‍යනුකූලව ඉඩ ඇත්තේය. එසේම එබඳු කොටසක් පිළිබඳව, පහත දක්වෙන බලතල ක්‍රියාවේ යෙදවීමට එම පාලක මණ්ඩලයට හෝ එහි සාමාජිකයින් වැඩිදෙනාට හෝ පිළිවන :—

(අ) ආරක්ෂකයකුද, මිනී වළවල් හාරන්නන්ද කිසියම් පොදු සුසානයක එබඳු කොටසක් පිළිබඳ ආරක්ෂාව හා ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වන වෙනත් සේවකයින්ද පත් කිරීමේ බලය ;

(ආ) එබඳු කොටසක කවර බිම් කට්ටියක හෝ කට්ටිවල වැළලීමේ විශේෂ අයිතිවාසිකමක් හෝ එහි එක් වැළලීම් එකක් හෝ වැඩි ගණනක් කිරීමේ අයිතිවාසිකම හෝ කිසියම් මිනී වළක් මත සිහිවටනයක් හෝ සොහොන් ගලක් තැන්පත් කිරීමේ අයිතිවාසිකම හෝ එබඳු කොටසක පිහිටි ගොඩනැගිල්ලක හෝ දේවස්ථානයක බිත්තිවල ස්මරණ සටහනක් කෙටීමේ අයිතිවාසිකම හෝ ප්‍රදානය කිරීමේ බලය ;

(ඇ) එබඳු කවර කොටසක වුවද ආදාහන කිරීම තහනම් කිරීමේ බලය ද වේ.

එමම වගන්තිය යටතේ දෙනු ලබන සෑම අවසර දීමනාවක්ම, එබඳු පාලක මණ්ඩලයක සාමාජිකයෙකු විසින් හෝ එම පාලක මණ්ඩලය මගින් පත් කරන ලද ආරක්ෂක තැන විසින් සාක්ෂිකාරයන් එක්කෙනෙකු හෝ වැඩි දෙනෙකු ඉදිරියේ අත්සන් තැබූ ලියවිල්ලකින්, දිය යුතුවාක් මෙන්ම, අමාත්‍යවරයාගේ අනුමතිය සහිතව එම පාලක මණ්ඩලය මගින් තීරණය කළයුතු ගාස්තුවක් හෝ ගාස්තු අයකිරීමෙන් පසුව එම අවසරය නිකුත් කළයුතු වන්නේය.

(3) අංක 22 දරන වගන්තියේ විධිවිධාන යටතේ පොදු සුසාන පාලකයාට ගෙවිය යුතු ගාස්තුවලට අමතර වශයෙන්, මෙම වගන්තිය යටතේ එබඳු කොටසකට ගෙවිය යුතු ගාස්තුව පාලක මණ්ඩලයට ගෙවිය යුතුවාක් මෙන්ම එම මණ්ඩලය විසින් භාර ගතයුතු වන්නේය. තවද එකී කොටස නිසි ආකාරයෙන් පවත්වා ගෙන යාම පිණිස එකී මණ්ඩලය විසින් එම මුදල යෙදිය යුතුය.

(4) අංක 16 දරන වගන්තිය යටතේ නිසි බලධරයකු විසින් පත් කරන ලද කිසියම් පොදු සුසාන පාලකයෙකු කෙරෙහි අංක 23 දරන වගන්තිය මගින් පැවරී ඇති යුතුකම්වලින් නිදහස් වීමට, මෙහි සඳහන් කිසිවක් හේතු නොවන්නේය. එහෙත් කිසියම් ආගමික නිකායක් සඳහා එබඳු සුසානයකින් වෙන්කර ඇති කිසියම් කොටසක් අංක 20 දරන වගන්තිය යටතේ ප්‍රදාන කිරීමේ ඔප්පුවක් එබඳු පාලකයෙකු විසින් අත්සන් නොකළ යුතුය.

12. පොදු සුසානයේ කිසිම කොටසක්, සුසානයක කටයුතුවලින් බාහිරවූ කිසිම් කටයුත්තක් සඳහා පාවිච්චි නොකළ යුතුය. මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීමත්, එබඳු වැළලීමක් හෝ ආදාහනයක් හා සම්බන්ධවූ කටයුතු වලින් බාහිරවූ සෙසු කිසියම් කරුණක් සඳහා එබඳු ඉඩමක් පාවිච්චි කරන කවර පුද්ගලයකු වුවද වරදකට වරදකාරයා වන අතර, එසේ වරදකාරයා කරනු ලැබීමේදී එබඳු එක් එක් වරදට රුපියල් දෙසියයකට වැඩි නොවන දඩයකටද යටත් වන්නේය.

පොදු සුසාන වැළලීම් සඳහා පමණක්ම පාවිච්චි කළයුතු බව.

13. මිය ගිය කිසියම් පුද්ගලයකුගේ අන්තිම කැමති පත්‍රයක බූදල් බලකාරයකු විසින් ආරාධිතව හෝ මිය ගිය කිසියම් පුද්ගලයකුගේ මෘතදේහය භාරව සිටින සෙසු කිසියම් තැනැත්තෙකු විසින් ආරාධිතව හෝ ආගමික නිකායක පූජකයකු, ආගමික දේවගැතියකු, පූජකයකු හෝ වෙනත් පුද්ගලයකුට ආගමික මෙහෙය සිදු කළ හැකිය.

ආගමික නිකායක පූජකයකුට ආගමික මෙහෙය සිදුකළ හැකි බව.

14. කිසිම පොදු සුසානයකට අයත් කිසිම ස්ථානයක භූමදාන කරන ලද මෘතදේහයක්, එම සුසානයේ සීමාව ඇතුළත අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියේ බලයක් නැතිව ඉවත් නොකළ යුතුය.

එසේ වුවද, අපරාධ නීතියේ කටයුතු සඳහා මරණ පරීක්ෂණයක් පැවැත්වීම සම්බන්ධයෙන් දැනට ඇති කවර බලතලයක් වුවද සීමා කිරීමට මෙම වගන්තියේ ඇති කිසිවක් හේතු නොවන්නේය.

බලයක් නැතිව මෘතදේහය ගෙන නොයා යුතු බව.

15. මෙයින් පසුව සඳහන් මත, පොදු සුසානයක පාලක තැන විසින් එම කාර්යය සඳහා තැබිය යුතු ලේඛනයක, සෑම භූමදානයක් හා සෑම ආදාහනයක්ම සටහන් කළ යුතුය. ඉදින්, අංක 11 දරන වගන්තියේ විධිවිධාන යටතේ පාලක මණ්ඩලයක් මගින් ආරක්ෂක යකු පත් කර ඇති අවස්ථාවකදී එම ආරක්ෂකයා විසින් සටහන් කළ යුතුය. එසේම, එබඳු ලේඛන හෝ ග්‍රන්ථ තැනැත්තෝ ඒවායේ සහතික කරන ලද උධෘත කොටස්, එබඳු භූමදාන හා ආදාහන සම්බන්ධයෙන් ප්‍රත්‍යක්ෂ සාක්ෂි හැටියට සෑම උසාවියක් විසින් ම භාර ගනු ලැබේ. තවද එබඳු කාර්යයක් සඳහා කලින් කල අමාත්‍ය වරයා විසින් පත් කළ යුතු නිලධාරි තැන මවන ඒවායේ පිටපත් හෝ ලිඛිත පිටපත් යැවිය යුත්තේ ය.

භූමදාන ලියා පදිංචි කළ යුතු බව.

16. පොදු සුසානයක් අරභයා පාලකයෙකු, වළවල් සාරන්නන් හා ආරක්ෂාව හා ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වියහැකි වෙනත් සේවකයන් නියි බලධරයා විසින් පත් කළ යුතු අතර, සුදුසු යයි ඔහුට වැටහෙන වැටුපක්, වේතනයක් හෝ දීමනාවක් ඔවුන්ට ගෙවන්නටද, ඔවුන් හෝ ඔවුන්ගෙන් යම් කිසිවෙකු ස්වකීය කැමැත්ත පරිදි සේවයෙන් අස් කරන්නටද ඔහුට පිළිවන.

පාලකයකු, වළවල් සාරන්නකු ආදීන් පත් කිරීම නියි බලධරයා විසින් කළයුතු බව.

17. පහත සඳහන් කරුණු අරභයා නියෝග සම්පාදනය කරන්නට නියි බලධරයාට පිළිවන:—

(අ) පොදු සුසානයක සිදු කරන සෑම භූමදානයක්ම විනීත ලෙසත්, හරුසරු ලෙසත් කළයුතු බව හා මිනීවළවල් ප්‍රමාණවත් ලෙස ගැඹුරු වියයුතු බව නිශ්චිත කිරීම;

විනීත ලෙසද හරුසරු ලෙසද හා මිනීවළවල ගැඹුර ආදී කරුණු පිළිබඳ නියෝග සම්පාදනය කිරීම.

CamScanner

(ආ) අංක 11 දරන වගන්තිය යටතේ සුසානයක විකුණන ලද කොටස්වලින් පිටස්තරවූ කිසියම් කොටසක් මිනී ආදාහන කිරීම සඳහා වෙන් කිරීම හා එබඳු ආදාහන සිදු කළයුතු ආකාරය විධිමත් කිරීම;

(ඇ) වැළලීමෙන් පසු නියමිත කාලසීමාවක් ඇතුළතදී මිනී වළවල් විවෘත කිරීම තහනම් කිරීම ; සහ

(1931, 7 වෙනි පනතේ 4 වෙනි වගන්තිය)

(ඈ) සුසාන පාලකයින්, ආරක්ෂකයන් හා මිනී වළවල් හාරන්නන් සතු යුතුකම් විස්තර කිරීම ද වේ.

දේවස්ථාන හෝ ගොඩනැගිලි තුළ හෝ ඒවාට ආසන්නව මිනී නොවැළලිය යුතු බව.

18. පොදු සුසානයේ කිසියම් දේවස්ථානයක් හෝ ගොඩනැගිල්ලක් යට කිසිම ගුහාවක හෝ එබඳු දේවස්ථානයක හෝ ගොඩනැගිල්ලක පිට බිත්තියෙන් අඩි පහකට ආසන්නව හෝ කිසිම මෘතදේහයක් නොවැළලිය යුතුය. එසේම මෙම වගන්තියේ විධිවිධාන වලට විරුඩ වන පරිද්දෙන් කිසිම මෘතදේහයක් භූමදාන කරන, කරවන හෝ එසේ කිරීමට අවසර දෙන හෝ මෘතදේහයක් එසේ වළලනු ලැබීමට සලස්වන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා කරනු ලැබීමේදී රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද යටත් වන්නේ ය.

පොදු සුසානයේ ඇතැම් කොටස් විශේෂ භූමදාන සඳහා වෙන්කර නොතැබිය හැකි බව.

19. මෙම ආඥා පනතේ අංක 11 දරන වගන්තිය යටතේ විකුණන ලද කොටස්වලට ඇතුළත් නොවූ පොදු සුසාන භූමියක කොටස්, විකුණන්නට හෝ අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, තමාට සුදුසු යයි හැඟෙන කොන්දේසිවලට ද අනුකූලව, එබඳු කිසියම් කොටසක භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම හෝ එක භූමදානයක් හෝ වැඩියක් කිරීමේ අයිතිවාසිකම සදාකාලයටම හෝ සීමාසහිත කාලයකට නොමිලයේ ප්‍රදානය කරන්නට හෝ තිබෙ බලධරයාට පිළිවන. එසේම, 11 වෙනි වගන්තිය යටතේ විකුණන ලද කොටසකට ඇතුළත් නොවූ සුසානයේ කවර කොටසක වුවද කිසියම් ස්මාරකයක් හෝ සොහොන් ගලක් පිහිටුවීමේ අයිතිවාසිකම හෝ එබඳු කිසියම් කොටසක් ඇතුළත පිහිටි දේවස්ථානයක හෝ ගොඩනැගිල්ලක කිසියම් පුවරුවක් හෝ අනුස්මරණ සටහනක් පිහිටුවීමේ අයිතිවාසිකම විකුණන්නට හෝ ප්‍රදානය කරන්නට ද ඔහුට පිළිවන.

(2) අංක 11 දරන වගන්තියේ විධිවිධාන යටතේ සුසානයේ කිසියම් කොටසක් හෝ කොටස් විකිණීමෙන් හෝ මෙම වගන්තියේ විධිවිධාන යටතේ කරනු ලබන කිසියම් විකිණීමකින් හෝ ලැබෙන සියලුම මුදල්, ඉදින් එම සුසානය මහා නගර සභා සීමාවක් ඇතුළත පිහිටා තිබේ නම් මහා නගර සභා අරමුදලෙහිත්* ප්‍රාදේශීය සභාවක සීමා ඇතුළත නම් එම සභාවේ අරමුදලෙහිත්, දිස්ත්‍රික් සභාවක හෝ සනීපාරක්ෂක සභාවක සීමා ඇතුළත නම් එබඳු සභාවක අරමුදලෙහිත්, මේ සියල්ලෙන්ම පිටස්තරවූ සුසානයක සම්බන්ධයෙන් නම් ඒකාබද්ධ මහා අරමුදලෙහිත් තැන්පත් කළ යුතුය.

---

* නගර සභාවක් හෝ පුර නගර සභාවක් පිහිටා ඇති නගරයක්දී ... එකී නගර සභාව හෝ පුර නගර සභාව සඳහාද මෙය අදාළ වන්නේය.

20. අංක 10 දරන වගන්තිය යටතේ සුසානයේ කවර ස්ථානයක වුවද භූමදාන කිරීමේ විශේෂ අයිතිවාසිකමද, එම ස්ථානයෙහි භූමදාන එකක් හෝ වැඩි ගණනක් සිදු කිරීමේ අයිතිවාසිකමද, නැතහොත්, ස්මාරකයක්, පුවරුවක් හෝ සොහොන් ගලක් තැන්පත් කිරීමේ අයිතිවාසිකමද, උපලේඛනයේ දක්වෙන අ, ආ යන ආකෘති දෙකින් එකක ආකාරයෙන් හෝ ඊට සමානව කළයුතු අතර, එය සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ සුසාන පාලකයා විසින් කළ යුතු වන්නේය.

භූමදානකිරීමේ විශේෂ අයිතිවාසිකම් ප්‍රදානය කිරීමේ ආකෘතිය.

21. (1) එබඳු සෑම ප්‍රදානයක්ම සටහන් කෙරෙන ලේඛනයක් සුසාන පාලකයා විසින් තබා ගත යුතු අතර, එම ප්‍රදානය සිදුකළ දිනයත්, ඒ හා සම්බන්ධවූ පක්ෂත්, ඉදින් එබඳු ප්‍රදානයක් සම්බන්ධයෙන් මුදල් අයකිරීමක් වී නම් එයත්, එම ප්‍රදානයෙහි විස්තරව ඇති භූමිය හඳුනා ගන්නට පුළුවන් වන පරිද්දෙන් ඒ පිළිබඳව කරනු ලබන නිසි විස්තරයකුත් ඇතුළත් ස්මරණ සටහනක්, යථෝක්ත ප්‍රදානය සිදු කොට දින දහතරක් ඇතුළත පූර්වෝක්ත සුසාන පාලකයා විසින් යථෝක්ත ලේඛනයේ සටහන් කළ යුතුය.

ප්‍රදාන පිළිබඳව ලේඛනයක් තබා ගත යුතු බව.

එසේ වුවද, 1862 අංක 12* දරන ආඥා පනත යටතේ සුසානයක කොටසක් මෙයින් ප්‍රථම වෙන් කර තබා ඇති විටක හෝ, මෙයින් පසුව 11 වෙනි වගන්තිය යටතේ කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා වෙන් කර ඇති විටෙක, එම කොටස සම්බන්ධයෙන් තබනු ලබන ලේඛනය, යථෝක්ත වගන්තිය යටතේ පත් කරන ලද ආරක්ෂකයා විසින් තැබිය යුතු වන්නේ ය.

(2) එබඳු ඕනෑ එක් සටහනක් සඳහා, නිසි බලධරයා විසින් සුදුසු යයි සලකනු කරන රුපියලකට වැඩි නොවන මුදලක් යථෝක්ත අවසරය දෙනු ලැබූ තැනැත්තාගෙන් අය කිරීමට සුසාන පාලකයාට බලය ඇත්තේය. එසේම සත පනහක මුදලක් ගෙවීමෙන් පසු, සුසාන පාලකයා විසින් තබනු ලබන ලේඛනය සෑම වේලාවකම, යථෝක්ත අවසරය ලැබූ තැනැත්තාට හෝ එම අයිතිවාසිකම තිල කරනු ලැබූ තැනැත්තාට පරීක්ෂා කර බැලීම සඳහා ඉඩ දිය යුත්තේය.

22. (1) සුසාන පාලකයාට ගෙවිය යුතු ගාස්තු සඳහාද, කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා නොවිකුණන ලද හෝ වෙන් නොකරන ලද සුසානයේ කිසියම් කොටසක භූමදාන පිළිබඳ ආගමික ක්‍රමයක් සම්බන්ධයෙන් ගාස්තු සඳහාද සුසානයේ කෙරෙන එබඳු වෙනත් මෙහෙයවල් සඳහාද සවකීය පාලන සීමා ඇතුළත පිහිටි සුසාන සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් නියෝග පැනවිය යුතුය.

ගාස්තු ආදිය සඳහා නිසි බලධරයා විසින් නියෝග සම්පාදනය කළ යුතු බව.

(2) කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා විකුණන ලද හෝ වෙන් කරන ලද සුසානයේ කිසියම් කොටසක් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු, අංක 11 දරන වගන්තියේ විධිවිධාන යටතේ එම කොටස වෙනුවෙන් පාලක මණ්ඩලයට ගෙවිය යුතු ගාස්තුව හැර වුවද, සුසාන පාලකයාට ගෙවිය යුතුය.

* 1877 අංක 8 දරන ආඥා පනතින් වෙනස් කරන ලදී.

සුසානයේ සැලැස්ම සහ කොටස්ලේඛනය පරීක්ෂාව සඳහා තැබිය යුතු බව.

23. සුසානයේ භූමිදාන සඳහා වෙන් කොට තබා ඇත්තාවූත්, භූමිදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම්ද ප්‍රදානය කොට ඇත්තාවූත් සෑම කොටසක්ම පිහිටි සෑම භූමිදාන කර තිබෙන ස්ථානයකම පිහිටීම පෙන්වීමට තරම් ප්‍රමාණවත් ලෙස විශාලවූ පරිමාණයක් අනුව සුසානයේ සැලැස්මක් සම්පාදනය කරන්නට නිසි බලධාරියා විසින් සැලැස්විය යුතුය. එබඳු සෑම භූමිදාන ස්ථානයක්ම අංකිත කළ යුතු අතර, එම අංක, සුසාන පාලකයා විසින් ඊ සඳහා තැබිය යුතු පොතක සටහන් කළ යුතුය. තවද එබඳු භූමිදාන කිරීමේ ස්ථානවල විශේෂ භූමිදාන කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රදානය කර ඇති ඒ ඒ පුද්ගලයන්ගේ නම් හා විස්තර එබඳු පොතෙහි අන්තර්ගත විය යුත්තේය. තවද එම සැලැස්මේ සලකුණු නොකොට, එසේම ඒ පිළිබඳ සටහනක් ඒ අනුව පූර්වෝක්ත ලේඛනයේ ඇතුළත් නොකොට, භූමිදාන කිරීමේ භූමියක් එම සුසානයේ ඇති නොකළ යුතුය. සුසාන පාලකයා විසින් තබන ලද පූර්වෝක්ත සැලැස්ම සහ ලේඛනය, නිසි බලධාරියා විසින් ඒ සඳහා නියම කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු සෑමෙන කවර වේලාවක වුවද මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා එය තැබිය යුතුය.

භූමිදාන කිරීමේ විශේෂ බලය පවරාදෙන ආකෘතිපත්‍රය.

පවරාදීම ලියා පදිංචි කළයුතු බව.

24. භූමිදාන කිරීමේ විශේෂ අයිතිවාසිකම් නිසි පරිදි දීමේ පැවරුම, උපලේඛනයේ "ඉ" ආකෘතියේ ආකාරයෙන් හෝ ඊට සමාන විත අයුරින් කළ යුතුය. එසේම, එය, සාක්ෂිකාරයන් එක් කෙනෙකු හෝ දෙදෙනෙකු ඉදිරියේදී කරන ලද නම් වලංගු වන්නේය. එබඳු සෑම පවරා දීමක්ම, ඉදින් එය ලංකාවේදී කරන ලද්දක් නම් එය පවරා දී හය මාසයක් ඇතුළතදීත්, සෙසු තැනෙක කරන ලද්දක් නම් එය ලංකාවට ලැබී හය මාසයක් ඇතුළතදීත්, සුසාන පාලකයා වෙතද නැතහොත්, 1802ගේ අංක 12* දරන ආඥා පනතේ 12 වෙනි වගන්තිය යටතේ මෙයින් පෙර වෙන් කොට තබන ලද සුසානයේ කොටසක් සම්බන්ධයෙන් හෝ මෙයින් පසු 11 වෙනි වගන්තිය යටතේ නිසි යම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය පිණිස වෙන් කරන ලද කොටසක් සම්බන්ධයෙන් නම්, එබඳු ආගමික නිකායේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. තවද එබඳු පවරා දීමක් පිළිබඳ ස්මරණ සටහනක්, මුලින් කරන ලද ප්‍රදානයේ සටහන ලෙසින්ම සුසාන පාලකයා හෝ පාලක මණ්ඩලය විසින් ලේඛනයේ ඇතුළත් කළ යුතුය. එබඳු ස්මරණ සටහනක් කරන තුරු එබඳු නිසි යම් පවරා දීමක් යටතේ කිසිම භූමිදානයක් භාර නොගත යුතුය. තවද එබඳු සෑම ස්මරණ සටහනක් සම්බන්ධයෙන්ම, නිසි බලධරයා සුදුසු යයි කල්පනා කරන ප්‍රමාණයේ, රුපියලකට නොවැඩි, ගාස්තුවක් අය කරන්නට සුසාන පාලකයාට හෝ පාලක මණ්ඩලයට බලය ඇත්තේය.

කැමැත්තක් නැතිව, භූමිදාන කිරීමේ විශේෂ අයිතියට අවසර නොකළ යුතු බව.

25. වැළලීමේ විශේෂ අයිතිවාසිකම ප්‍රදානය කර ඇති කිසිම තැනක, එම අවස්ථාවේදී භූමිදාන කිරීමේ එම විශේෂ අයිතිය ඇතිව සිටින්නාගේ කැමැත්ත ඇතිව මිස, කිසිම මෘතදේහයක් භූමිදාන නොකළ යුතුය.

---

* 1899ගේ අංක 9 දරන ආඥා පනතින් අවලංගු කරන ලදි.

26. අංක 11 දරන වගන්තිය යටතේ පිහිටුවන ලද සුසානයේ කිසියම් කොටසක නම් පාලක මණ්ඩලයේද, සුසානයේ සෙසු කිසියම් කොටසක නම් නිසි බලධරයාගේද බලය නොමැතිව ගොඩනංවන ලද කිසියම් ස්තූපාකාර කොතක්, ස්මාරකයක්, පුවරුවක් හෝ කොටන ලද ස්මරණ සටහනක් එය තිබූ තැනින් ගලවා ඉවත් කරන්නට, පිළිවෙළින් පාලක මණ්ඩලයට හෝ නිසි බලධාරයාට පිළිවන.

නුසුදුසු ලෙස ගොඩනැංවූ ස්මාරක ඉවත් කිරීම.

27. කිසියම් පොදු සුසානයක සිරුරු ඇතුළත භූමදාන කිරීම හෝ ආදාහන කිරීම ආදියේදී ආගමික මෙහෙය පැවැත්වීම සඳහා දේවස්ථානයක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ගොඩනැංවීමට බලය දීම හෝ කිසියම් ආගමික නිකායක විශේෂ ප්‍රයෝජනය සඳහා සුසානයේ කොටසක් ඉල්ලා සිටින ආගමික නිකායකට එම කොටස ප්‍රදානය කිරීමේ හෝ විශේෂයෙන්ම භූමදාන කිරීමේ අයිතිවාසිකම හෝ නිසි බලධාරයා විසින් ප්‍රතික්ෂේප කරන හැම අවස්ථාවකදී ද, නැතහොත් සුසානයක කොටසක් වෙන් කිරීම සඳහා එබඳු ආගමික නිකායකින් අධිකතර මුදලක් ඉල්ලා සිටි කල්හි ද එබඳු ආගමික නිකායක් විසින් ඉල්ලා සිටියහොත්, ඉදින් එසේ කිරීම සුදුසු ලෙස පෙනේ නම්, එබඳු සුසානයක් සම්බන්ධයෙන් අංක 9, 11 සහ 19 යන වගන්තිවල විධිවිධාන වලින් හෝ එයින් කවර වගන්තියකින් හෝ නිසි බලධරයා කෙරෙහි පැවරී ඇති බලතල සියල්ලම හෝ කිසියම් බල තලයක් අමාත්‍යවරයා විසින් පාවිච්චි කිරීම නීත්‍යනුකූල වන්නේය.

අංක 9, 11 සහ 19 දරන වගන්ති වලින් පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදවීම; නිසි බලධරයා ප්‍රතික්ෂේප කළ අවස්ථාවකදී ඒවා ක්‍රියාවේ යෙදවීමට අමාත්‍යවරයාට පිළිවන් බව.

28. කිසියම් පොදු සුසානයකට අයත් කිසියම් ගොඩනැගිල්ලක්, බිත්තියක් හෝ වැටක් හිතාමතාම විනාශ කරන්නාවූ හෝ එබන්දකට අනතුරු කරන්නාවූ නැතහොත් එහි ඇති කිසියම් ගසක් හෝ පැළෑටියක් විනාශ කරන්නාවූ හෝ එබන්දකට අනතුරු කරන්නාවූ නැතහොත් එහි කිසියම් බිත්තියක් කැත කරන්නාවූ හෝ විකෘති කරන්නාවූ නැතහොත් එහි හෝ එහි කිසියම් බිත්තියක කිසියම් දැන්වීමක් අලවන්නාවූ නැතහොත් කිසියම් පොදු සුසානයක් තුළ පිහිටුවා ඇති ස්මාරකයක්, පුවරුවක්, කොටූ සටහනක් හෝ සොහොන් කොතක් හිතාමතාම විනාශ කරන්නාවූ හෝ එබන්දකට හානි කරන්නාවූ සෑම කෙනෙක්ම වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා කරනු ලැබීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකටද යටත් වන්නේය.

පොදු සුසානයකට හානිකිරීමට දඬුවම.

29. කවර පොදු සුසානයක වුවද කිසියම් ක්‍රීඩාවක හෝ කෙළි සෙල්ලමක යෙදෙන්නාවූ හෝ සුබ අවමංගලයකදී හැර තුවක්කු පාවිච්චි කරන්නාවූ සෑම පුද්ගලයෙක්ද, නැතහොත් මෘතදේහයක් භූමදාන කිරීම හෝ ආදාහනය කිරීම සඳහා සුසානයකට රැස්වූ කිසියම් පුද්ගලයෙකුට හිතාමතාම හෝ නීති විරෝධී ලෙස කරදර ඇති කරන සෑම පුද්ගලයෙක්ද, නැතහොත් කිසියම් සුසානයක් ඇතුළත කිසියම් කලබලකාරී දෙයක් කරන සෑම කෙනෙක්ද, වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා වීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකටද යටත් වන්නේය.

පොදු සුසානයේ ක්‍රීඩා පවත්වන හෝ කෙළිකෙළි පවත්වන හෝ කලබ කරදරකාරී වැඩක යෙදෙන අයට දඬුවම.

30. මෙම ආඥා පනත යටතේ සම්පාදිත කිසියම් නියෝගයක් කඩ කරන කවර පුද්ගලයෙක් වුවද වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා වීමේදී රුපියල් සියයකට වැඩි නොවන දඩයකටද යටත් වන්නේය.

නියෝග කඩකිරීම.

## III වෙනි පරිච්ඡේදය

### පුද්ගලික සුසාන

*"පොදු පූජ්‍ය ස්ථානය" යන්නෙහි අර්ථ කථනය.*

31. මෙම පරිච්ඡේදයෙහි ලා "පොදු පූජ්‍ය ස්ථානය" යන්නෙහි සිය ලුම දෙව්මැදුරු, පල්ලි, සියලුම වර්ගයේ පන්සල්, සියලුම වර්ගයේ මුස්ලිම් පල්ලි සහ සුසානයේ භූමදානයන් කිරීමේදී ආගමික මෙහෙය සඳහා විශේෂයෙන් පාවිච්චි කරනු ලබන ඒ සඳහා සුසානයේ ඉදිකරවන ලද දේවස්ථාන හැර සෙසු දේවස්ථානද ඇතුළත් වන්නේය.

*පොදු පූජ්‍ය ස්ථාන ආදියෙහි භූමදාන කිරීම තහනම් කර ඇති බව.*

32. කිසිම පොදු පූජ්‍ය ස්ථානයක හෝ ඒ හා සම්බන්ධවූ විස්තර කරන ලද කිසියම් භූමි ප්‍රමාණයක් ඇතුළත, නියෝගයක සඳහන් දිනයේ සිට කිසියම් මෘත දේහයක් හෝ දෙණක් වැළලීම හෝ ආදාහන කිරීම, නීති විරෝධී බව ප්‍රකාශ කරමින් කලින් කල නියෝගයක් කරන්නට අමාත්‍යවරයාට පිළිවන. එබඳු නියෝගයක සඳහන් කාලයෙන් පසු, මෙම වගන්තියේ විධිවිධානවලට විරුද්ධව පරිද්දෙන් කිසියම් මෘතදේහයක් හෝ දෙණක් වළලන්නාවූ හෝ ආදාහන කරන්නාවූ, නැතහොත් මෘතදේහයක් හෝ දෙණක් වළලන්නට හෝ ආදාහන කරන්නට සිද්ධකරවන්නාවූ, අවසර දෙන්නාවූ හෝ සලස්වන්නාවූ සෑම තැනැත්තෙක්ම වරදක වරදකාරයා වන අතර එසේ වරදකාරයා වීමේ දී රුපියල් තුන් සියයකට නොවැඩි දඩයකටද යටත් වන්නේය.

*අලුත් පුද්ගලික සුසාන අමාත්‍ය වරයා විසින් අනුමත කළ යුතු බව.*

33. නිසි බලධරයාගේ නිර්දේශය පිට, අමාත්‍යවරයා විසින් කලින් අනුමත කරනු නොලැබූ කිසිම නගරයක, දිස්ත්‍රික්කයක හෝ ස්ථානයක අලුත් පුද්ගලික සුසාන ඇති කිරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතුය. එබඳු අනුමත කිරීමක් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකිරීමෙන් ප්‍රකාශයට පත්කළ යුතුය. අලුත් පුද්ගලික සුසාන යක් සඳහා එවනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම මිනින්දෝරු ආඥා පනත යටතේ බලපත්‍ර ලැබූවාවූ මිනින්දෝරු කෙනෙකු විසින් සම්පාදනය කරන ලද, එබඳු පුද්ගලික සුසානයේ පිහිටීම පැහැදිලි ලෙස පෙන්වන සැලැස්මක් ද විය යුතුය.

*පුද්ගලික සුසාන වල භූමදාන හා ආදාහන කිරීම් නැවැත්වීම.*

34. නිසි බලධරයා විසින් කරුණු දක්වනු ලැබීමෙන් පසුව, කිසියම් නගරයක, දිස්ත්‍රික්කයක හෝ ස්ථානයක පිහිටි කිසියම් පුද්ගලික සුසානයක් එම නගරයේ, දිස්ත්‍රික්කයේ, ප්‍රදේශයේ හෝ ස්ථානයේ වාසය කරන්නවුන්ගේ සෞඛ්‍යයට හානිකරවූ තත්වයකින් හෝ වට පිටාවකින් පවතී යයි අමාත්‍යවරයාට පෙනී ගියහොත්, එබඳු කවර පුද්ගලික සුසානයක වුවද නියෝගයක සඳහන් කාලයෙන් පසුව භූමදාන හෝ ආදාහන කිරීම නැවැත්විය යුතු යයි නියෝග කිරීමට අමාත්‍යවරයාට නීත්‍යනුකූලව බලය ඇත්තේය. එබඳු සෑම නියෝගයක්ම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුත්තේය.

*පුද්ගලික සුසානවල භූමදාන හෝ ආදාහන නැවැත්වීමේ නියෝගයකින් පසුව එසේ නොකළ යුතු බව.*

35. එබඳු නියෝගයක සඳහන් කර ඇති කාලයට පසු, එම නියෝගයේ සඳහන් කර ඇති කවර පුද්ගලික සුසානයක හෝ මෘතදේහයක් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම නීත්‍යනුකූල නොවන්නේය. තවද එම වගන්තියට විරුද්ධ වන පරිද්දෙන්, යට කියන ලද කාලයෙන් පසුව මෘතදේහයක් භූමදාන කරන්නාවූ හෝ

භූමදාන කිරීම හෝ ආදාහන සිදු ආදාහන කරන්නාවූ, නැතහොත් භූමදාන කරවන, ඊට අවසර දෙන හෝ ඊට මං සලස්වන, නැතහොත් භූමදාන කිරීමට හෝ ආදාහන කිරීමට සහාය වන්නාවූ සෑම කෙනෙක්ම වරදකට වරදකාරයා වන අතර එසේ වරදකාරයා කරනු ලැබීමේදී රුපියල් සූත් සියයකට නොවැඩි දඩයකට ද යටත් වන්නේය.

පුද්ගලික සුසාන කොටුකර තැබිය යුතු හා කැලෑ වෙත් එළි පෙහෙළි කර තැබිය යුතු බව.

36. කවර පුද්ගලික සුසානයක් වුවද තමාට සෑහේ යයි තීරණය කරන කාලසීමාවක් තුළදී කොටු කරන ලෙසත්, එහි වැවී ඇති කැලෑ හෝ වල් පදුරු එළි කරන ලෙසත්, එම සුසානයේ භාරකාරයින්ට, කළමනාකාරවරුන්ට හෝ අයිතිකාරයන්ටද නැතහොත් එය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් භාරව සිටින පුද්ගලයන්ට නියම කරන්නට නිසි බලධරයාට නීත්‍යානුකූලව පිළිවන. එදින් එබඳු නියමයක් අනුව කටයුතු නොකළහොත්, යථෝක්ත පුද්ගලික සුසානයේ පූර්වෝක්ත භාරකාරයින්ගේ, කළමනාකාරයින්ගේ හෝ අයිතිකාරයින්ගේ හෝ එය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් භාරව සිටින පුද්ගලයන්ගේ වියදමින් එය නිසියාකාර කොටු කරවන්නට හෝ එහි වැවී ඇති කැලෑ හෝ වල් පදුරු එළි කරවන්නට හෝ නිසි බලධරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

බලපත් නැතිව මෘතදේහයක් පුද්ගලික සුසානයකින් ආපසු ගෙනයා නොහැකි බව.

37. කිසියම් පුද්ගලික සුසානයක් පිහිටා ඇති ප්‍රදේශයට අධිකරණ බලය ඇති දිස්ත්‍රික් උසාවියේ බලයක් නැතිව කවර පුද්ගලික සුසානයක කවර කොටසක හෝ භූමදාන කරන ලද මෘතදේහයක් එය දිරුණු නැතිත් ආපසු ගෙන නොයා යුතුය.

(1937, අංක 14 2 වගන්තිය)

එසේ වුවද, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 305 වෙනි වගන්තියේ විධිවිධානවලට එම වගන්තියේ කිසිවකින් කිසිම වෙනසක් හෝ සීමා කිරීමක් සිදු නොවන්නේය.

අතුරු ව්‍යවස්ථා

38. පහත සඳහන් කරුණු සඳහා කලින් කල අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීම නිසි බලධරයාට නීත්‍යානුකූලව කළ හැක්කේය:

(අ) පුද්ගලික සුසාන පරීක්ෂා කිරීම;

(ආ) එබඳු සුසානවල භූමදාන කිරීම හා ආදාහන කිරීම හරියාකාර විධිමත් කිරීම හා මිනී වළවල් හරියාකාර ගැඹුරින් යුක්ත කරවීම;

(ඇ) නියමිත ප්‍රදේශයක ඇතුළත පිහිටි පුද්ගලික සුසාන ලියාපදිංචි කිරීම, ඒවායේ සීමාද එහිම විස්තර කළ යුතුය;

(ඈ) සාමාන්‍ය වශයෙන් සියලුම පුද්ගලික සුසාන නිසියාකාර පාලනය කිරීම, විධිමත් කිරීම, ආරක්ෂා කිරීම හා සීමා කිරීම, හා එහි සීමා ඇතුළත නිශ්ශබ්දතාවය, සුන්දරත්වය හා පිරිසිදු බව ආරක්ෂා කිරීම ද වේත්.

තවද කවර වේලාවකදී වුවද, අවලංගු කළ හැකි, වෙනස් කළ හැකි හෝ සංශෝධනය කළ හැකි අන්දමේ අතුරු ව්‍යවස්ථාද පනවා ගත හැක්කේය.

අතුරු ව්‍යවස්ථා අමාත්‍යවරයා විසින් අනුමත කළයුතු බව

39. එබඳු අතුරු ව්‍යවස්ථා, ඒවා වෙනස් කරන්නට, සංශෝධනය කරන්නට හෝ තමන්ට සුදුසු යයි හැඟෙන හැටියට ඒවාට ඉඩ නොදෙන්නට, නැතහොත් ඒවා අවලංගු කිරීමකට, වෙනස් කිරීමකට හෝ සංශෝධනය කිරීමකට මෙයින් බලය දෙනු ලබන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ, ඔහු විසින් අනුමත කෙරෙන තුරු එබඳු කිසිම අතුරු ව්‍යවස්ථාවක් වලංගු නොවන්නාක් මෙන්ම ඒවායේ බලයක්ද ඇති නොවන්නේය. තවද, එබඳු සියලුම අතුරු ව්‍යවස්ථාද ඒවායේ කිසියම් අවලංගු කිරීමක්, වෙනස් කිරීමක් හෝ සංශෝධනයක්ද ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

එසේ වුවද, එබඳු සියලුම අතුරු ව්‍යවස්ථා උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය රැස්වෙන සමයක නම් එසේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර මාසයක් ඇතුළතදීද, ඉදින් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය රැස් නොවෙන සමයක නම් ඊළඟ රැස්වීම් ආරම්භවී මාසයක් ඇතුළතදීද එසේ සවර ආකාරයකින් වුවද එම මන්ත්‍රී මණ්ඩල පිළිබඳ රැස්වීම් සතරකදී ම යථෝක්ත අතුරු ව්‍යවස්ථා ඉදිරිපත් කර තිබිය යුතුය. එසේ ඉදිරිපත් කිරීමකදී යථෝක්ත මන්ත්‍රී මණ්ඩලවල යෝජනාවකින් නිෂ්ප්‍රභ වන සවර අතුරු ව්‍යවස්ථාවක් වුවද අවලංගු වන අතර එහි බලයක්ද ඇති නොවන්නේය.

## IV වෙනි පරිච්ඡේදය

### දණ්ඩන විධිවිධාන උසාවි බලතල

ලියාපදිංචි නොකරන ලද පුද්ගලික සුසාන වල හෝ පොදු සුසානයක් නොවූ තැනක භූමදාන කිරීම හා ආදාහන කිරීම තහනම් බව.

40. විස්තර කරන ලද ප්‍රදේශ ඇතුළත පුද්ගලික සුසාන ලියාපදිංචි කිරීමේ විධිවිධාන පිළිබඳවූ අතුරු ව්‍යවස්ථා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ දිනයේ සිට මාස තුනක් ඉකුත්වීමේ සිට හා එයින් පසුව, මෙම ආඥා පනතේ විධිවිධාන යටතේ හෝ 1802 කේ අංක 12* දරන ආඥා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද පොදු සුසානයක් නොවන්නාවූ, නැතහොත් එබඳු අතුරු ව්‍යවස්ථාවලින් නියමිත ආකාරයෙන් ලියාපදිංචි කරන ලද පුද්ගලික සුසානයක් නොවන්නාවූ පූර්වෝක්ත විස්තර කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටි කිසිම තැනෙක කිසිම මෘතදේහයක් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම නීති විරෝධි වන්නේය. යට කියන ලද පරිදි මාස තුනක් ඉකුත් වීමෙන් පසුව, මෙම වගන්තියේ විධිවිධානවලට විරුද්ධ වන පරිද්දෙන් කිසියම් මෘතදේහයක් භූමදාන කරන්නාවූ හෝ ආදාහන කරන්නාවූ නැතහොත් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම සිදු කරවන, ඊට අවසර දෙන හෝ ඊට මං සලස්වන නැතහොත් මෘතදේහයක් භූමදාන කිරීමට හෝ ආදාහන කිරීමට සහාය වන්නාවූ සෑම කෙනෙක්ම වරදකට වරදකාරයා වන අතර, එසේ වරදකාරයා කරනු ලැබීමේදී රුපියල් තුන්සියයකට වැඩි නොවන දඩයකට ද යටත් වන්නේය.

එසේ වුවද, මෙම ආඥා පනතේ විධිවිධාන යටතේ හෝ 1862 කේ අංක 12* දරන ආඥා පනතේ විධිවිධාන යටතේ හෝ පිහිටුවන ලද පොදු සුසානයක් නොවූද, එබඳු අතුරු ව්‍යවස්ථා මගින් නියමිත

* මෙම ආඥා පනත 1899 යේ අංක 9 දරන ආඥා පනතින් අවලංගු කරන ලදී.

ආකාරයෙන් ලියාපදිංචි කරන ලද පුද්ගලික ප්‍රසංගයක් නොවූද, කවර ප්‍රසංගයක වුවද මහජනයන් ඇතුළත් කිරීමට හෝ ආදායම කිරීමට අවසර දීමට නිසි බලධරයාට හෝ, ඉදින් ඒ නිසි බලධරයා මහා නගර සභාවක්, නගර සභාවක්, දිස්ත්‍රික් සභාවක් හෝ මණ්ඩලයක්වූ විට* එම බලමණ්ඩලයේ නිසි බලධරයා වූ සභාපතිවර යාට හෝ නීතියෙන් ඉඩ ඇත්තේය. එබඳු කිසියම් ඇතුළත්වීමක් හෝ ආදායමක් සම්බන්ධයෙන් මෙම ආඥා පනතේ විධිවිධාන අදාළ නොවන්නේය.

41. මෙම ආඥා පනත යටතේ සම්පාදනය කොට ප්‍රසිද්ධ කරන කවර අතුරු ව්‍යවස්ථාවක් වුවද කඩ කිරීම වරදක් වන අතර එබඳු කඩ කිරීමක් සම්බන්ධයෙන් වරදකාරයා කරනු ලබන සෑම පුද්ගල යෙක්ම රුපියල් තුන් සියයකට වැඩි නොවන දඩයකට යටත් වන්නේය. තවද එම වරද දිගටම කර ගෙන ගිය අවස්ථාවකදී නම්, එසේ එම වරද කරන එක් එක් දවසකට රුපියල් සියයකට නො වැඩි අතිරේක දඩයකටද යටත් වන්නේය.

අතුරු ව්‍යවස්ථා කඩ කිරීම වරදක් වන බව.

42. මෙම ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සම්පාදිත කවර අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පවරන ලද සියලුම නඩු මෙයට විරුද්ධව අපරාධ නඩු විධාන සංග්‍රහයේ හෝ [illegible] කිසියම් ආඥා පනතක කුමක් සඳහන්ව තිබුණද ඒ නඩු සම්බන්ධයෙන් මෙහි නියමිත සම්පූර්ණ දඬුවම නියම කරන්නටත්, මහේස්ත්‍රාත් උසාවි වලට මෙයින් බලය පවරනු ලැබේ.

වැරදි සම්බන්ධ යෙන් ක්‍රියා කිරීමට මහේස් ත්‍රාත් උසාවිවලට බලය දී ඇති බව.

43. යම් වරදක් කර මාස තුනක් ඇතුළත ඒ පිළිබඳව නඩු පැවරීම ආරම්භ නොකරන ලද්දේ නම්, මෙම ආඥා පනතේ විධි විධානවලට විරුද්ධවීමේ වරදකට කවර පුද්ගලයෙකුට හෝ විරුද්ධව නඩු පැවරිය නොහැකිය.

නඩු පැවරීම පිළිබඳ සීමා කිරීම.

44. මෙම ආඥා පනත යටතේ නඩු පවරනු ලැබූ යමෙකු වරදකාරයා කිරීමට ප්‍රථම, එම වරද පිළිබඳ තොරතුරු සැපයූ හැඟවත්තාට යථෝක්ත නඩුවෙන් දඩ ගසනු ලැබ ඇත්ත වශයෙන්ම ගෙවනු ලැබූ මුදලෙන් භාගයකට වැඩි නොවන, උසාවියට සුදුසු යයි වැටහෙන මුදලක් පරිත්‍යාග කරන්නට උසාවියට නීත්‍යනුකූලව බලය තිබේ.

තොරතුරු සපයන්නාට දඩයෙන් කොටසක්.

45. මෙම ආඥා පනත යටතේ කරන ලද වරදක් සම්බන්ධයෙන් හෝ මෙම ආඥා පනත යටතේ සම්පාදිත අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීම සම්බන්ධයෙන් හෝ අය කර ගනු ලබන සෑම දඩ මුදලක්ම, ඉහත දක්වුණු වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඉදින් එම වරද සිදුකරන ලද්දේ මහා නගර සභාවක හෝ දිස්ත්‍රික් සභාවක හෝ ලෝකල් බෝඩ් සභාවක හෝ සනීපාරක්ෂක සභාවක පරිපාලන සීමා ඇතුළත පිහිටි ස්ථානයක නම්, මහා නගර සභාවට හෝ දිස්ත්‍රික් සභාවට හෝ ලෝකල් බෝඩ් සභාවකට හෝ සනීපාරක්ෂක සභාවටත්* ගෙවිය යුතු අතර සෙසු සියලු නඩු සම්බන්ධයෙන් එය ඒකාබද්ධ මහා අරමුදලෙහි තැන්පත් කළ යුතු වන්නේය.

දඩ මුදල් යොදවන අන්දම.

* නගර සභා, සුළු නගර සභා සඳහාද අදාළ විය යුතුය.

## උපලේඛනය

### “අ” ආකෘතිය

පොදු භාරයක අයිතිය භාරයෙන් ප්‍රදානය කරන ආකෘතිය

(29 වෙනි වගන්තිය)

පොදු භාරකාර හා පුද්ගලික භාරකාර පිළිබඳ ආඥා පනත යටතේ ආණ්ඩුව විසින් ——වන් ——— මස —— දින නිකුත් කරන ලද නියෝගයේ බලය පවරණකොට ගෙන ———ගේ පොදු භාරකාරයන් පිහිටුවන ලදින්, පනත අනුගත කරන මම එකී භාරකාර පාලකයා වෙමි.

එහෙයින් කරුණු, ——— පදිංචි ——— විසින් මට ගෙවන ලද රු. ——— මුදල වෙනුවෙන්, ඉහත කී ආඥා පනතේ ... වන විධාන යටතේ, මුලින් කී භාරකාර පාලකයා හැටියට (මෙම ප්‍රදානය කරන්නට බලාපොරොත්තු වන භූමිය විස්තර කරනු) පූර්වෝක්ත ———ට සදහටම අයිතිය සඳහා මම ප්‍රදානය කරමි.

මගේ අත්සන යොදා ප්‍රදානය කරන ලද්දේ වර්ෂ ——— ——— මස —— දින දීය.

### “ආ” ආකෘතිය

පොදු භාරයක අයිතිය සඳහා කොමිෂමේ අයිතිය ප්‍රදානය කිරීමේ ආකෘතිය

(29 වෙනි වගන්තිය)

පොදු භාරකාර සහ පුද්ගලික භාරකාර පිළිබඳ ආඥා පනත යටතේ ආණ්ඩුව විසින් ——වන් ——— මස —— දින නිකුත් කරන ලද නියෝගයේ බලය පවරණකොට ගෙන ———ගේ පොදු භාරකාරයන් පිහිටුවන ලදින් පනත අනුගත කරන මම එකී භාරකාර පාලකයා වෙමි.

තවද මෙහි පසු සඳහන් කර ඇති [illegible] පනත දක්වා ඇති [illegible] කොමිෂමේ ප්‍රදානය කිරීම අවශ්‍යතාවය විසින් අනුමත කොට ඇත්තේය.

එහෙයින් මට කියන ලද භාරකාර පාලකයා වූ මම, [illegible] ආඥා [illegible] වන විධාන යටතේ (මෙහි ප්‍රදානය කරන්නට බලාපොරොත්තු වන භූමිය විස්තර කරනු), [illegible], ——— වෙත අයිතිය කිරීමේ විශේෂ අයිතිවාසිකම්. මෙහි අමුණා ඇති කොන්දේසි පිළිබඳ උපලේඛනයේ විස්තර කර ඇති කොන්දේසිවලට යටත්ව, අයිතිය කිරීම සඳහා සදහටම පවතින පරිද්දෙන් ප්‍රදානය කරමි.

19—— ——— මස —— දින මගේ අත්සන යොදා දෙන ලදී.

———,
භාරකාර පාලක [illegible].

### “ඉ” ආකෘතිය

අයිතිය කිරීමේ අයිතිවාසිකම් පවරා දීමේ අයිතිය

(21 වෙනි වගන්තිය)

——— පදිංචි ට. ඕ. වන මම, ——— පදිංචි ඕ. ඩී. විසින් මා වෙත ගෙවන ලද රු. ——— මුදල භාරගෙන, පොදු භාරකාර හා පුද්ගලික භාරකාර පිළිබඳ ආඥා පනත යටතේ සම්බන්ධිත භාරකාරයේ කැලැත්තේ අංක ——— දරන්නාවූද, වර්ෂ —— මස ——— දින දරණ ප්‍රදානයෙන් මා වෙත සදහටම ප්‍රදානය කරන ලද්දාවූද (මෙහි ස්ථානය විස්තර කරනු) නම් ස්ථානයේ අයිතිය කිරීමේ විශේෂ අයිතිවාසිකම්, ඒ පිළිබඳව මා තුළ ඇති අයිතිය, උරුමය හා සම්බන්ධතාවන් සහ එකී ඕ. ඩී. ට සදහටම තිබෙන පරිද්දෙන්, එම මා විසින් යම් කොන්දේසිවලට එකඟව දරන ලද්දේ නම් එම සියලුම කොන්දේසිවලට එකඟව: (මෙහි එම භූමිය විස්තර කරනු) ස්ථානයේ අයිතිය කිරීමේ විශේෂ අයිතිවාසිකම් එකී ඕ. ඩී. හට මෙයින් පවරා දෙන්නෙමි.

19—— ——— මස —— වෙනි දින මගේ අත්සන තබමි.